සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**07 ශ්‍රේණිය** | තෙවන වාර පරීක්ෂණය - 2024 | **50 S I,II**

නම: ........................................ | **නාට්‍ය හා රංගකලාව** | **කාලය පැය දෙකයි**

## I කොටස

★ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

★ **පහත දැක්වෙන පද්‍ය කොටස් ඇසුරෙන් 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A හුරු බුහුටියි මේ පැටවුන්
අහිංසකයො වගේ පෙනෙයි

B කවුරුද ලෙඩ වෙන්නේ
මමයි බේත් දෙන්නේ

C මහත් වැඩක් තව කියමි අසන්නේ
පහත්ව පා ළඟ දෙමව්පියන්ගේ

D ඇටිකිති වුස්
කුකුලු වරස්
හාවා කළ එකෙල මෙකෙල

E මේ පුටු කාගේ බංඩාරේ
මේ ඇඳ කාගේ බංඩාරේ

01) ඉහත පද්‍ය අතුරින් එළිවත් කෑමේ ජන ක්‍රීඩාවට අයත් අක්ෂරය වන්නේ,
1. A ය. 2. B ය. 3. D ය. 4. E ය.

02) පාලිත ලොකුපෝතාගම මහතා විසින් නිර්මාණය කරන ලද නාට්‍යයකට අයත් අක්ෂරය වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

03) ''පුංචි අපට දැන් තේරෙයි'' නාට්‍යයෙහි පද්‍ය කොටස් ඇතුළත් අක්ෂරය වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

04) ''හීල් බත් දංකුඩ'' ජන කතාවට අයත් පද්‍ය ඇතුළත් අක්ෂරය වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

05) ''සිරිත් මල්දම'' ග්‍රන්ථයේ පද්‍ය ඇතුළත් අක්ෂරය වන්නේ,
1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

★ **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06) වේදිකා නාට්‍යයක් නරඹන පුද්ගලයා හඳුන්වනු ලබන්නේ,
1. රසිකයා ලෙස ය. 2. පාඨකයා ලෙස ය. 3. ප්‍රේක්ෂකයා ලෙස ය. 4. නරඹන්නා ලෙස ය.

07) ගුවන් විදුලි නාට්‍යයකි,
1. මානස විල 2. මුවන්පැලැස්ස 3. රූකඩ ගෙදර 4. නළ දමයන්ති

08) කටහඬ අභ්‍යාස සඳහා යොදාගනු ලබන ග්‍රන්ථයකි,
1. බුද්ධ ගජ්ජය 2. සුභාෂිතය 3. මහාවංශය 4. ජාතක කතා පොත

09) පරිසරයේ ඇසෙන ස්වභාවික හඬක් නොවන්නේ,
1. කුරුළු හඬයි. 2. සුළඟේ හඬයි. 3. අත්පුඩි හඬයි. 4. අකුණු හඬයි.

10) ''කටේ කිරි සුවඳ යන්නට පවා බැරි වුණා - යුදට උපන් කුමරෙකු යැයි නමක් ඇතිවුණා'' ගීතයෙන් කියැවෙන කතාව,
1. ආගමික කතාවකි. 2. වීර කතාවකි. 3. ජන කතාවකි. 4. යෝධ කතාවකි.

★ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට අදාලව දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ දී ඇති වරහන තුළ යොදන්න.

11) අභිරූපණයේ දී ආංගික හා සාත්වික අභින මූලික වේ. ( )

12) රංගාලෝකය අනුෂාංගික කලාවට අයත් නොවන්නකි. ( )

13) ගුවන් විදුලි නාට්‍ය සජීවී නාට්‍ය කලාවට අයත් ය. ( )

14) ඓතිහාසික කතා, නාට්‍ය පෙළ රචනයට වඩාත් සුදුසු ය. ( )

15) චිත්‍ර කලාවේ දායකත්වය නාට්‍යයට අවශ්‍ය නොවේ. ( )

★ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(පරිකල්පනය, ශිථිලකරණය, අනුකරණය, රංගනය, සාත්වික අභිනය, ආහාර්ය අභිනය)

16) ........................................ යනු අප දැක ඇති සිද්ධියක් නැවත කර පෙන්වීමයි.

17) මුහුණින් හැඟීම් ප්‍රකාශනය ........................................ අභිනය යි.

18) කය, මනස අතර මනා සම්බන්ධතාවයක් ගොඩනැගීම මඟින් .................................... සාර්ථක කර ගත හැක.

19) අලුතින් යමක් සිතීමේ හැකියාව ................................................... ලෙස හැඳින්වේ.

20) ............................................ යනු ශරීරය සැහැල්ලු කිරීමයි.

(1 x 20 = 20)

## II කොටස

★ පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

01) පහත සඳහන් දෙබස් කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| දොස්තර මාමා | :- මොනවද දැන් අමාරු |
| අම්මා | :- කිසිම දෙයක් කන්නේ නෑ |
| 1 යාළුවා | :- කිසිම දෙයක් බොන්නේ නෑ |
| අම්මා | :- කිසිම දෙයක් නැතිව අදට දවස් 5 ක් වෙනවා |
| දොස්තර මාමා | :- දවස් පහක් (පුදුමයෙන්) දිව දාන්න හොඳට හුස්ම ගන්න.......... |

i. මෙම දෙබස් ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද? (ල. 02)
ii. එහි රචකයා කවුරුන් ද? (ල. 02)
iii. මෙම කොටස ඉදිරිපත් කිරීමට නළු නිළියන් කී දෙනෙකු අවශ්‍ය ද? (ල. 02)
iv. මෙහි එන රංග විධානයක් ලියන්න. (ල. 02)
v. දොස්තර මාමා ලෙඩ බලන්නේ කාගේ ද?. එයට හේතුව කුමක් ද? (ල. 02)

02) i. රංගන ශිල්පියෙකු නිරත විය යුතු රංග අභ්‍යාස 02 ක් ලියන්න. (ල. 02)
ii. රංග අභ්‍යාස වලින් ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න. (ල. 04)
iii. පංති කාමරයේ දී ඔබ විසින් කරනු ලැබූ රංග අභ්‍යාසයක් විස්තර කරන්න. (ල. 04)

03) i. නාට්‍යයක දී භාවිතා වන වේෂභූෂණ යනු මොනවා ද? (ල. 02)
ii. වේෂ භූෂණ නිර්මාණයේ දී සැළකිලිමත් විය යුතු කරුණු 02 ක් ලියන්න. (ල. 04)
iii. ඔබ කැමති චරිතයකට අදාළ වේෂ භූෂණයක් ඇඳ ඒ සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය 02 ක් නම් කරන්න. (ල. 04)

04) i. අභිනය යනු කුමක් දැයි විස්තර කරන්න. (ල. 02)
ii. සතර අභිනය නම් කරන්න. (ල. 04)
iii. ඉන් එක් අභිනයක් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 04)

05) චරිත, සංවාද, රංග විධාන, ගැටුම්, අවස්ථා සහිතව ඔබ දන්නා ජන කතාවක් හෝ ඓතිහාසික කතාවක් ඇසුරින් නාට්‍ය පෙළක් රචනා කරන්න. (ල. 10)